කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# පුරප්පාඩු

## පොල් පර්යේෂණ ආයතනය

පොල් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. <u>ජ්‍යෙෂ්ඨ කළමනාකරු (වතු) තනතුර</u>

**වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද**

- බාහිර

**වෘත්තීය සුදුසුකම්:** පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය පිළිබඳ වූ උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Postgraduate) තිබීම.

**සහ**

**පළපුරුද්ද** : රජයේ දෙපාර්තමේන්තුවක / අර්ධ රාජ්‍ය දෙපාර්තමේන්තුවක හෝ පිළිගත පුද්ගලික ආයතනයක හෙක්ටයාර 100 කට නොඅඩු පොල් වත්තක් පාලනය පිළිබඳව අවම වශයෙන් වසර 15 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

- අභ්‍යන්තර

**වෘත්තීය සුදුසුකම් :** පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය පිළිබඳ වූ උපාධියක් තිබීම.

**සහ**

**පළපුරුද්ද** : කළමණාකරු (වතු) ලෙස කළමනාකරණ මට්ටමේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55 ටවිය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- **වැටුප් කාණ්ඩය** : HM 1-1
- **වැටුප් පරිමාණය** : රු. 80,295 /-15x2,270/-114,345 /-
- **ආරම්භක වැටුප් තලය** : රු. 80,295.00 - (2/2016 (I) ක. සේ. චක්‍රලේඛය ප්‍රකාරව)

- **අනෙකුත් ප්‍රතිලාභ :**

මූලික වැටුපට අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.

i. ප්‍රවාහන දීමනාව - රු.50,000/-
ii. ඉන්ධන දීමනාව
iii. ජීවන වියදම් දීමනාව - රු.7800/-
iv. වෘත්තීය දීමනාව
v. සන්නිවේදන දීමනාව
vi. තේ දීමනාව

# 02.<u>ගණකාධිකාරි තනතුර</u>

### වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද

- බාහිර

**වෘත්තීය සුදුදුකම් :** ශ්‍රී ලංකා ගණකාධිකාරි ආයතනයේ අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම (ICASL) හෝ වරලත් කළමණාකරන ගණකාධිකාරි ආයතනයේ අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම් (CIMA) හෝ සහතිකලත් ගණකාධිකාරි සංගමයේ (ACCA) අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම් හෝ වසර හතරක කළමණාකරණය හෝ වාණිජවේදී ගෞරව උපාධිය

, **සහ**

**පළපුරුද්ද :** රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථා / මණ්ඩල හෝ පිළිගත් වෙළඳ ආයතනයක ගිණුම්කරණය / විගණනය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳව අවම වශයෙන් වසර තුනක (03) පශ්චාත් පළපුරුද්ද

- **අභ්‍යන්තර :** කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 අදාල ක්ෂේත්‍රයේ සතුටුදායක පළපුරුද්දක් ලබා තිබීම.

  **සටහන :** පරිගණකගත ගිණුම් ක්‍රම පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

- **වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය :** MM 1-2

- **වැටුප් පරිමාණය :** රු. 54,550/-10x1,375/-15x1,910/-96,950/-

- **ආරම්භක වැටුප් තලය : රු.** 54,550.00 (2/2016 ක. සේ. චක්‍රලේකය ප්‍රකාරව)

- **අනෙකුත් ප්‍රතිලාභ** :

මූලික වැටුපට අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.

ජීවන වියදම් දීමනාව - රු.7800/-
වෘත්තීය දීමනාව
සන්නිවේදන දීමනාව
තේ දීමනාව

# 03.ජාල පරිපාලක තනතුර

**වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :**

- **බාහිර :**
  පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව පිළිබඳ උපාධිය සමග අවම වශයෙන් වසර තුනක පුළුල් ප්‍රදේශ ජාල (Wide Area Network) පිළිබඳ පශ්චාත් පළපුරුද්ද.

  **සටහන :** දත්ත කළමනාකරණ පද්ධති (Database Management), වෙබ් යෙදවුම් සංවර්ධණ (Web Application Development) සහ සම්මත මෘදුකාංග පැකේජ (Standard Software Packages) පිළිබඳ පළපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

- **වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය** : MM 1-2
- **වැටුප් පරිමාණය** : රු. 54,550/-10x1,375/-15x1,910/-96,950/-
- **ආරම්භක වැටුප් තලය:** රු.54,550/- (2/2016 ක. සේ. චක්‍රලේඛය ප්‍රකාරව)
- **අනෙකුත් ප්‍රතිලාභ** :

  මූලික වැටුපට අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.
  i. ජීවන වියදම් දීමනාව - රු.7800/-
  ii. වෘත්තීය දීමනාව
  iii. සන්නිවේදන දීමනාව
  iv. තේ දීමනාව

# 04.ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි තනතුර

**වෘත්තීය සුදුසුකම්**

- **බාහිර :**
  පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් සිව් අවුරුදු (4) විශේෂ පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත විද්‍යාව හෝ කෘෂිකර්ම උපාධිය

**හෝ**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් සිව් අවුරුදු (4) විශේෂ දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහිත විද්‍යාව හෝ කෘෂිකර්ම උපාධිය සමග අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ එක් අවුරුදු පශ්චාත් උපාධිය.

**හෝ**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් විද්‍යාව හෝ කෘෂිකර්ම උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ දෑ අවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධිය.

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (Ph.D) සමග ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 08 ක පර්යේෂණ පළපුරුද්ද.

- **අභ්‍යන්තර :**

  ආචාර්ය උපාධිය (Ph.D) සමග අවම වශයෙන් AR 1 ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරියෙකු වශයෙන් වසර 08 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

  **හෝ**

  දෑ අවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධිය (M.Phil/M.Sc.) සමග AR 1 ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරියෙකු වශයෙන් වසර 10 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

**සටහන** : අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණ පත්‍රිකා සකස් කර තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- **වැටුප් කාණ්ඩය** : AR 2
- **වැටුප් පරිමාණය** : රු. 76,200/-10x2,000/-96,200/-
- **ආරම්භක වැටුප් තලය** : රු.76,200/- (2/2016 (I) ක.සේ. චක්‍රලේඛය ප්‍රකාරව )
- **අනෙකුත් ප්‍රතිලාභ** :

  මූලික වැටුපට අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.

  i. ජීවන වියදම් දීමනාව - රු.7800/-
  ii. වෘත්තීය දීමනාව
  iii. සන්නිවේදන දීමනාව
  iv. තේ දීමනාව

## 05.ජ්‍යෙෂ්ඨ තාක්ෂණ භූවමාරු නිලධාරි තනතුර

### වෘත්තීය සුදුසුකම්

- **බාහිර :**

  පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් සිව් අවුරුදු විශේෂ පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත විද්‍යාව හෝ කෘෂිකර්මය උපාධිය

  **හෝ**

  පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් සිව් අවුරුදු විශේෂ දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහිත විද්‍යාව හෝ කෘෂිකර්ම උපාධිය සමග අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ එක් අවුරුදු පශ්චාත් උපාධිය.

  **හෝ**

  පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් විද්‍යාව හෝ කෘෂිකර්මය උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ දෑ අවුරුදු පශ්චාත් පර්යේෂණ උපාධිය.

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (Ph.D) සමග ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් තාක්ෂණ හුවමාරු පිළිබඳ වසර 08 ක පළපුරුද්ද.

- **අභ්‍යන්තර :**
  ආචාර්ය උපාධිය (Ph.D) සමග අවම වශයෙන් AR 1 ශ්‍රේණියේ තාක්ෂණ හුවමාරු නිලධාරියෙකු වශයෙන් වසර 08 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

**හෝ**

දෑ අවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධිය (M.Phil/M.Sc.) සමග AR 1 ශ්‍රේණියේ තාක්ෂණ හුවමාරු නිලධාරියෙකු වශයෙන් වසර 10 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

**සටහන :** අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණ පත්‍රිකා සකස් කර තිබීම අතිරේක සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- **වැටුප් කාණ්ඩය** : AR 2
- **වැටුප් පරිමාණය** : රු. 76,200/-10x2,000/-96,200/-
- **ආරම්භක වැටුප් තලය** : රු. 76,200/- (2/2016 (I) ක.සේ. චක්‍රලේඛය ප්‍රකාරව )
- **අනෙකුත් ප්‍රතිලාභ** :
  මූලික වැටුපට අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.
  i. ජීවන වියදම් දීමනාව - රු.7800/-
  ii. වෘත්තීය දීමනාව
  iii. සන්නිවේදන දීමනාව
  iv. තේ දීමනාව

## 06.තාක්ෂණ හුවමාරු නිලධාරි තනතුර

**වෘත්තීය සුදුසුකම්:**

- **බාහිර :**
  පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් සිව් අවුරුදු විශේෂ පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත විද්‍යා හෝ කෘෂිකර්මය උපාධිය .

**හෝ**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් සිව් අවුරුදු විශේෂ දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහිත විද්‍යා හෝ කෘෂිකර්මය උපාධිය සමග අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ එක් අවුරුදු පශ්චාත් උපාධිය.

**හෝ**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් විද්‍යා හෝ කෘෂිකර්මය උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ දෑ අවුරුදු පශ්චාත් පර්යේෂණ උපාධිය.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත

- **වැටුප් කාණ්ඩය** : AR 1

- **වැටුප් පරිමාණය** : රු. 53,150/-10x1,375/-15x1,910/-95,550/-

- **ආරම්භක වැටුප් තලය :** රු.53,150.00 - (2/2016 (I) ක. සේ. චක්‍රලේඛය ප්‍රකාරව)

- **අනෙකුත් ප්‍රතිලාභ** :

  මූලික වැටුපට අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.

  i. ජීවන වියදම් දීමනාව - රු.7800/-
  ii. වෘත්තීය දීමනාව
  iii. සන්නිවේදන දීමනාව
  iv. තේ දීමනාව

## 07.<u>වතු අධිකාරි තනතුර</u>

**වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද**

- **බාහිර** : පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය පිළිබඳ වූ උපාධිය සමඟ හෙක්ටයාර 50 කට වැඩි වතු පාලනය පිළිබඳ අවුරුද්දක (01) පශ්චාත් පළපුරුද්දක් තිබීම.

- **අභ්‍යාන්තර** : පිළිගත් උපාධියක් සහ සහකාර වතු අධිකාරිවරයෙකු ලෙස අවුරුදු 05 සතුටුදායක සේවයක් සපුරා තිබීම.

  **හෝ**

  කළමනාකරණ සහකාර - තාක්ෂණික කාණ්ඩයේ පළමුවන ශ්‍රේණියේ ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස වසර 05 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

**සටහන** : පොල් වතු පාලනය හා කම්කරු පාලනය පිළිබඳ පළපුරුද්ද ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය** : JM 1-2

- **වැටුප් පරිමාණය** : රු. 43,355/-10x755/-18x1,135/-71,335/-

- **ආරම්භක වැටුප් තලය** : රු. 43,355/- (2/2016 ක.සේ.චක්‍රලේඛය ප්‍රකාරව )
- **අනෙකුත් ප්‍රතිලාභ** :
  මූලික වැටුප අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.
  i. ජීවන වියදම් දීමනාව - රු.7800/-
  ii. සන්නිවේදන දීමනාව
  iii. ගාස්තු රහිතව අංග සම්පූර්ණ නිල නිවාස පහසුකම් (කම්කරුවකු සහිත)
  iv. ස්ථානභාර දීමනාව ( රු.4,000.00 – 12,000.00 )
  v. තේ දීමනාව

## 08.සහකාර වතු අධිකාරි තනතුර

**වෘත්තීය සුදුසුකම්**

- **බාහිර** : පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය/ වැවිලි කළමනාකරණය පිළිබඳ වූ උපාධියක් තිබීම.

- **අභ්‍යන්තර** : අදාළ ක්ෂේත්‍ර සඳහා දෑ අවුරුදු ඩිප්ලෝමාවක් සහ කළමනාකරණ සහකාර සේවා ගණයේ II ශ්‍රේණියේ ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස අවුරුදු 05 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

  **සටහන** : පොල් වතු කළමනාකරණය හා කම්කරු පාලනය පිළිබඳ දැනුමක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය** : MA 3
- **වැටුප් පරිමාණය** : රු. 32,200/-10x445/-11x660/-10x730/-5x750/-54,960/-
- **ආරම්භක වැටුප් තලය** : රු. 32,200/- (2/2016 ක.සේ. චක්‍රලේඛය ප්‍රකාරව )
- **අනෙකුත් ප්‍රතිලාභ** :

  මූලික වැටුපට අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.
  1. ජීවන වියදම් දීමනාව - රු.7800/-
  2. තේ දීමනාව

## 09.කාර්මික ශිල්පී (ශ්‍රව්‍ය දෘශ්‍ය) තනතුර

**වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :**

- **බාහිර :**

  අ.පො.ස (සමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව (සිංහල / දෙමළ,) ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග එකවර අවම වශයෙන් විෂයන් 6 කින් සමත් වී තිබීම සහ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අදාළ විෂයය සංයුතිය සමග එකවර විෂයන් තුනකින් සමත්වීම හා පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට නොඅඩු දෑ අවුරුදු ඩිප්ලෝමාවක් අදාළ ක්ෂේත්‍ර සඳහා ලබා තිබීම.

  **සහ**

  ශ්‍රව්‍ය / දෘශ්‍ය උපකරණ හැසිරවීම පිළිබඳ වසරක පශ්චාත් පළපුරුද්දක් තිබිම.

- **වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ටනොඅඩු විය යුතු අතර අතර 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස සීමාව බල නොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය** : MA 2-2
- **වැටුප් පරිමාණය** : රු. 30,310/-10x300/-7x350/-4x600/-20x710/-52,360/-
- **ආරම්භක වැටුප් තලය** : රු. 30,310.00 (2/2016 ක. සේ. චක්‍රලේඛය ප්‍රකාරව)
- **අනෙකුත් ප්‍රතිලාභ** :

මූලික වැටුපට අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.

i. ජීවන වියදම් දීමනාව - රු.7800/-
ii. තේ දීමනාව

# 10.රසායනාගාර සහ ක්ෂේත්‍ර සහකාර තනතුර

**වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :**

- **බාහිර** : අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව (සිංහල / දෙමළ) , ඉංග්‍රීසි හා විද්‍යාව / කෘෂිකර්මය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග එකවර අවම වශයෙන් විෂයයන් 06 කින් සමත් වීම සහ අ.පො.ස (උ.පෙළ) විද්‍යා විෂයන්ගෙන් එකවර විෂයයන් තුනකින් සමත්වීම.

  **සටහන** :රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක,ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක රසායනාගාරයක ලද පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වනු ඇත.

- **අභ්‍යන්තර :** පහත දැක්වෙන සුදුසුකම් ඇති ප්‍රාථමික මට්ටමේ ශිල්පීය (PL 3), ප්‍රාථමික මට්ටමේ අර්ධ ශිල්පීය (PL 2), ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන (PL 1) සේවකයින් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

  අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව (සිංහල / දෙමළ) , ඉංග්‍රීසි හා විද්‍යාව / කෘෂිකර්මය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග එකවර අවම වශයෙන් විෂයයන් 06 කින් සමත් වීම

  **සහ**

  ඉහත සඳහන් සේවා කාණ්ඩයේ ස්ථිර සේවයේ අවම වශයෙන් වසර පහක (05) සේවයක් සම්පූර්ණ කර තිබීම.

**සේවා අවශ්‍යතාවන්**

a. දුර බැහැර ප්‍රදේශවල පිහිටි පොල් වතු වලද ක්ෂේත්‍ර රාජකාරි කටයුතු කිරීමට සිදුවේ.
b. යතුරුපැදි පැදවීමේ වලංගු බලපත්‍රක් හිමි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- **වැටුප් කාණ්ඩය** : MA 1-2
- **වැටුප් පරිමාණය** : රු. 27,910/-10x300/-7x350/-12x600/-12x710/-49,080/-
- **ආරම්භක වැටුප් තලය** : රු. 27,910.00 (2/2016 ක.සේ. චක්‍රලේඛය ප්‍රකාරව)

- **අනෙකුත් ප්‍රතිලාභ :**

  මූලික වැටුපට අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.

  i. ජීවන වියදම් දීමනාව - රු.7800/-

  ii. තේ දීමනාව

**<u>පොදු කොන්දේසි</u>**

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයකින් පසුවිය යුතුයි.
3. අයදුම්කරු දිවයින තුල ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

**<u>පොදු ප්‍රතිලාභ</u>**

1. 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා පනත යටතේ හා 2016.04.25 දිනැති අංක 2/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව පාරිතෝෂික ගෙවනු ලැබේ.
2. දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
3. අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් වැටුපෙන් 10% ක් හා මණ්ඩලය විසින් 15% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහාද දායක වනු ඇත.)
4. පොල් පර්යේෂණ ආයතනයේ සේවයකයින් හට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභද හිමිවනු ඇත

අයදුම්කරුවන් විසින් <u>උප්පැන්න සහ අනෙකුත් අදාළ සියළුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත් වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග අයදුම්කරු විසින් **අත්සන් කරන ලද**</u> තම අයදුම්පත **2023/12/22** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ප්‍රමාද වී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ අදාල ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකිය.

ලිපි කවරයේ වම්පස ඉහල කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාල සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

**මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

මෙම දැන්වීම පොල් පර්යේෂණ ආයතනයේ වෙබ් පිටුව වන www.cri.gov.lk මගින්ද බලා ගත හැක.

සභාපති<br>
පොල් පර්යේෂණ මණ්ඩලය<br>
ලුණුවිල